ශීර්ෂය 291 වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව - 2024

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 291 - වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2025 මැයි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2025 ජූලි 16 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින් , මූල්‍ය තත්ත්වය ,මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංසෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව, වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලූම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරිම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) දේපළ පිරියත හා උපකරණ

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	හම්බන්තොට ප්‍රදේශීය ඉංජිනේරු කාර්යාලය පිහිටි ඉඩමේ අයිතිය පැවරීමේ සහතිකය වර්ෂයේදී 2022 දෙපාර්තමේන්තුවට ලැබී තිබුණද , එය තක්සේරු කර එම වටිනාකම මූල්‍ය නොවන වත්කම් ලෙස ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. මේ හේතුවෙන් දෙපාර්තමෙන්තුවේ මූල්‍ය නොවන වත්කම් එම වටිනාකමින් අඩුවෙන් දැක්විණි.	අවශ්‍ය කටයුතු කිරීම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව වෙත ඉල්ලීම් ඉදිරිපත් කර ඇත.	අයිතිය දෙපාර්තමේන්තුව සතු ඉඩම් තක්සේරු කර මූල්‍ය නොවන වත්කම් ලෙස ගිණුම්ගත කිරීමට කටයුතු කල යුතුය.
(ii)	අයිතිය දෙපාර්තමේන්තුව සතුනොවූ හෙක්ටයාර් 0.7941 ක ප්‍රමාණයේ මාතර, මොරටුව හා ගොඩවායේ පිහිටි ඉඩම් 03 ක් රු.42,007,000 කට තක්සේරු කර මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ මූල්‍ය නොවන වත්කම් යටතේ දක්වා තිබුණි. මේ හේතුවෙන් මූල්‍ය තත්ව ප්‍රකාශයේ මූල්‍ය නොවන වත්කම් වටිනාකම එම වටිනාකමින් වැඩියෙන් දැක්විණි.	ඉඩම් කැබලි 03 හි අයිතිය දෙපාර්තමේන්තුව වෙත පවරා ගැනීමට අවශ්‍ය කටයුතු කිරීමට විමසා ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවට අදාල ප්‍රාදේශීය කාර්යාල මගින් ලිපි යොමු කර ඇත.	අයිතිය දෙපාර්තමේන්තුව සතු වූ මූල්‍ය නොවන වත්කම් පමණක් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ මූල්‍ය නොවන වත්කම් ලෙස ගිණුම් ගත කිරීමට කටයුතු කල යුතුය.
(iii)	දෙපාර්තමේන්තුව සතුව පවතින යතුරුපැදි 08ක වටිනාකම තක්සේරු කර සමාලෝචිත වර්ෂය අවසානය දක්වා මූල්‍ය නොවන වත්කම් යටතේ ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. ඉන් යතුරුපැදි 02ක් සමාලෝචිත වර්ෂය තුළ කිසිදු ගිණුම්ගත කිරීමකින් තොරව අපහරණය කර තිබූ අතර තවත් යතුරුපැදියක් අස්ථානගත වී තිබුණි.	ධාවන තත්වයේ නොපවතින යතුරු පැදි සහ අළුත්වැඩියා කල හැකි තත්වයේ පවතින යතුරු පැදි අළුත්වැඩියා කිරීම සහ අළුත්වැඩියාවෙන් පසුව එම කාර්යාලවලට නැවත ලබා දීමට කටයුතු කරමින් පවතී.	දෙපාර්තමේන්තුව සතු සියළුම යතුරුපැදි තක්සේරු කර මූල්‍ය නොවන වත්කම් යටතේ ගිණුම්ගත කිරීමට කටයුතු කල යුතුය.

(iv)	ව්‍යාපෘති කාර්යයන් සඳහා මොරටුව හා මීගමුව ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලවලට අනුයුක්ත කර ඇති යන්ත්‍රෝපකරණ හතරක වටිනාකම තක්සේරු කර මූල්‍ය නොවන වත්කම් යටතේ ගිණුම් ගත කිරීමට කටයුතු කර නොතිබුණි. මේ හේතුවෙන් මූල්‍ය තත්ව ප්‍රකාශයේ මූල්‍ය නොවන වත්කම් වටිනාකම අඩුවෙන් දැක්වුණි.	යන්ත්‍ර 04 න් 03 ක් මේ වන විට සේවයෙන් ඉවත් කර ඇති අතර අපහරණය කිරීම සඳහා කටයුතු කරමින් පවතී.	සේවයේ යොදවන යන්ත්‍ර තක්සේරු කර ගිණුම්ගත කිරීමටත්, සේවයෙන් ඉවත්කර ඇති යන්ත්‍ර අළුත් වැඩියා කිරීමට හෝ අපහරණ ක්‍රියාවලියට යොමු කිරීමට කටයුතු කල යුතුය.
(v)	සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයන්හි මූල්‍ය නොවන වත්කම් සම්බන්ධයෙන් වූ ඒසීඒ 06 ආකෘතිය ප්‍රකාරව, ඉදිකිරීම් උපකරණ හා ප්‍රවාහන උපකරණයන්හි අවසාන ශේෂ පිළිවෙලින් රු.140,290,875 ක් හා රු.141,940,000 ක් ලෙස දක්වා තිබුණද, විගණනයට ඉදිරිපත් කරන ලද උපලේඛණවලට අනුව එම වටිනාකම් පිළිවෙලින් රු.139,500,000 හා රු. 145,400,000 ක් වූයෙන් පිළිවෙලින් රු.790,875 ක් හා රු. 3,460,000 ක වෙනසක් නිරික්ෂණය විය	දෙපාර්තමේන්තු පොත්, CIGAS පද්ධතිය හා ඒසීඒ 06 භාණ්ඩාගාර මුද්‍රිත පිටපත් අනුව අවසාන වටිනාකම වන රු.141,940,000 නිවැරදි බව සඳහන් කරමි.	මූලාශ ලේඛනයන්හි සඳහන් වටිනාකමට අනුරූප වන පරිදි වත්කම් ගිණුම්ගත කිරීමට කටයුතු කල යුතුය.

(ආ) මූල්‍ය වත්කම්

විගණන නිරික්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
2024 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ගිණුම පිළිබඳ ප්‍රකාශයේ (ඒසීඒ 3 ආකෘතිය ප්‍රකාරව) නොපියවූ අග්‍රිම ශේෂය ලෙස පවතින රු. 1,023,108 ක් වූ මැතිවරණ දෙපාර්තමේන්තුවෙන් ලැබිය යුතු මුදල, මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයේ මූල්‍ය වත්කම් ලෙස දක්වා නොතිබුණි. මේ හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට මුළු වත්කම් ශේෂය හා භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කලයුතු ශුද්ධ වත්කම් ශේෂය එම වටිනාකමින් අඩුවෙන් දැක්විණි.	2024 දෙසැම්බර් 31 දිනට ඒසීඒ 3 ආකෘතියේ දක්වා ඇති නොපියවූ අග්‍රිම ශේෂය මහා භාණ්ඩාගාරයට ප්‍රේෂණය කල යුතු වගකීමකි. එබැවින් මූල්‍ය තත්ව ප්‍රකාශයේ ජංගම වගකීම් යටතේ පෙන්නුම් කර ඇත.	මැතිවරණ දෙපාර්තමේන්තුවෙන් ලැබිය යුතු මුදල නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කල යුතුය.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

ඉකුත් වර්ෂයට අදාළ වාර්තාවේ ඡේද යොමුව	ක්‍රියාත්මක කර නොතිබුණු නිර්දේශය	මෙම වාර්තාවේ ඡේද යොමුව
1.6.1 (අ)(i)	ඉකුත් වර්ෂය තුළ හම්බන්තොට ප්‍රදේශීය ඉංජිනේරු කාර්යාලය පිහිටි ඉඩමේ අයිතිය පැවරීමේ සහතික ලැබී තිබුණ ද එය තක්සේරු කර එම වටිනාකම මූල්‍ය නොවන වත්කම් ලෙස ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු වීම.	1.6.1 (අ)(i)
1.6.1 (අ)(ii)	අයිතිය දෙපාර්තමේන්තුව සතු නොවූවද ඉකුත් වර්ෂයන් හි මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි මූල්‍ය නොවන වත්කම් යටතේ රු.42,007,000 කට තක්සේරු කර දක්වා ඇති හෙක්ටයාර් 0.7941 ක ප්‍රමාණයේ මාතර, මොරටුව හා ගොඩවායේ පිහිටි ඉඩම් 03 හි අයිතිය දෙපාර්තමේන්තුව වෙත පවරාගැනීමට කටයුතු කළ යුතු වීම.	1.6.1 (අ)(ii)
1.6.1 (අ)(iii)	දෙපාර්තමේන්තුව සතුව පවතින සියළුම යතුරුපැදි තක්සේරු කර නිවැරදි වටිනාකම් ගිණුම්ගත කළ යුතු වීම.	1.6.1 (අ)(iii)
1.6.1 (අ)(iv)	ව්‍යාපෘති කාර්යයන් සඳහා මොරටුව හා මීගමුව ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලවලට අනුයුක්ත කර ඇති යන්ත්‍රෝපකරණ හතරෙහි වටිනාකම තක්සේරු කර මූල්‍ය නොවන වත්කම් යටතේ ගිණුම් ගත කළ යුතු වීම.	1.6.1 (අ)(iv)

3. මූල්‍ය සමාලෝචනය

3.1 ආදායම් කළමනාකරණය

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
ලංකා මිනරල් සැන්ඩ්ස් ලිමිටඩ් ආයතනය වෙත 2017 වර්ෂයේ සිට 2020 දෙසැම්බර් 31 දක්වා කාලපරිච්ඡේදය තුළ ලබාදී ඇති බලපත්‍රමගින් අනුමතකල වැලි කියුබ් ප්‍රමාණය ඉක්මවා වැලි කැණීම් සිදුකිරීම සම්බන්ධයෙන් අයවිය යුතු මුදල රු.79,369,500 ක් විය. නමුත්, එම ආයතනය විසින් රු.	අමතර කැණීම් සඳහා වූ රජයට අයවිය යුතු රු.79,369,500 ක මුදලින් රු. 64,056,000 ක් 2024 ජනවාරි සිට වසර 5 කින් ගෙවීමට එකඟවී ඇත. ඒ අනුව 2024 වර්ෂයේ රු. 19,285,700 ක් ගෙවා ඇත. ගෙවීමට ඇති මුළු	අයවිය යුතු මුදල් සම්බන්ධයෙන් ලිඛිත එකඟතාවයක් හෝ ගිවිසුමක් ඇතිකර ගැනීමට කටයුතු කල යුතුය.

64,059,000ක් පමණක් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු මුදල ලෙස ගණනය කර තිබුණි. කෙසේ වෙතත්, ගෙවිය යුතු මුළු මුදලෙන් සියයට 24ක් පමණ වන රු. 19,285,700 ක් පමණක් 2024 වර්ෂය අවසානය වනවිට ගෙවා තිබුණි. දෙපාර්තමේන්තුවේ ලේඛන අනුව, තවදුරටත් අයවීමට ඇති මුදල රු. 60,083,800 ක් අය කිරීමට කිසිදු ලිඛිත එකඟතාවයක් හෝ ගිවිසුමක් ඇතිකර ගැනීමට කටයුතු කර නොතිබුණි.	මුදලත්, එකගවී ඇති මුළු මුදලත් අතර විචල්‍යතාවයක් පවතින බැවින් (රු.15,310,500.00) එම හිග මුදල ගෙවීමට කටයුතු කරන ලෙස දන්වා අංක: PA/LMSL/Pul&Mula/2023 සහ 2024.04.25 දාතමින් ලිපියක් යොමු කර ඇත.	

3.2 වියදම් කළමනාකරණය

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
සමාලෝචිත වර්ෂයේ වාහන නඩත්තු, මෘදුකාංග නඩත්තු, ගොඩනැගිලි නඩත්තු හා පුනරුත්ථාපනය වෙනුවෙන් වෙන්කර තිබූ ඇස්තමේන්තුගත ශුද්ධ ප්‍රතිපාදනයෙන් පිළිවෙලින් රු.4,194,946 හෙවත් සියයට 49ක්, රු.733,246ක් හෙවත් සියයට 73ක් හා රු.908,291ක් හෙවත් සියයට 61ක් ඉතිරිවී තිබුණි. එසේ වුවද වාහන සංචිතයේ පැවති වාහන 9ක අලුත් වැඩියා හා නඩත්තු කටයුතු තවදුරටත් පැවතීම, බලපත්‍ර ආදායම් මෘදුකාංගය සඳහා වාර්ෂික ගාස්තු ගෙවීමට පැවතීම, පරිගණක සඳහා වෛරස් ගාඩ්වල අවශ්‍යතා පැවතීම සහ තවදුරටත් අලුත්වැඩියා කල යුතු තත්වයේ ගොඩනැගිලි පැවතියදී ඒ වෙනුවෙන් වෙන්කල ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබුණි.	පවතින වාහන සඳහා රියදුරු හිඟය හේතුවෙන් සෑම දවසකම වාහන සියල්ලම ධාවනය කිරීමේ හැකියාවක් නොමැති වීමෙන් වාහන සේවා කිරීම් වාර ගණන සීමිතවීම, දෙපාර්තමේන්තුවේ බලපත්‍ර ආදායම් මෘදුකාංගයට අදාලව වාර්ෂිකව ගෙවිය යුතු ගෙවීම් මේ වන තෙක්ම වැය විෂය අංක 2509(2) යටතේ සිදුකිරීම, ගොඩවාය නිවාඩු නිකේතනයේ පූර්ණ අළුත්වැඩියාවක් සිදු කළයුතු අතර ඒ සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන නොමැති වීම හේතුවෙන් ඉදිරි කටයුතු සිදු කර ගැනීමට නොහැකි වීම නිසා ප්‍රතිපාදන ඉතිරිවිය.	නිවැරදි ඇස්තමේන්තු යටතේ ප්‍රතිපාදන ඉල්ලුම්කිරීමටත් ලද ප්‍රතිපාදන ප්‍රශස්ථ ලෙස උපයෝජනය කිරීමටත් කටයුතු කල යුතුය.

3.3 බැරකම් හා බැදීම්වලට එළඹීම

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත්, වර්ෂය අවසානයේ බැදීම් සහ බැරකම් ප්‍රකාශනයට අනුව කිසිදු බැදීමක් හෝ බැරකමක් වාර්තාකර නොමැති වුවද, භාණ්ඩාගාර මුද්‍රිත පිටපතේ එස්ජ් 92 ප්‍රකාරව වැය විෂයන් 3ක එකතුව රු.218,073ක්වූ බැරකම් පැවති අතර දෙපාර්තමේන්තුවේ 2025 වර්ෂයේ ජනවාරි, පෙබරවාරි හා මාර්තු මාසවල වවුචර්පත් පරීක්ෂාවේදී වැය විෂයන් 10කට අදාලව එකතුව රු.3,818,244ක්වූ 2024 වර්ෂයේ වියදම් වෙනුවෙන් 2025 වර්ෂයේ ගෙවීම් කර තිබීමෙන් එකතුව රු.4,036,317ක වාර්තා නොවූ බැරකම් පැවතුණි.	2024 වර්ෂයේ පැවති බැරකම් CIGAS පද්ධතියට ඇතුලත් කලද ගිණුම් තැබීමේදී අතපසුවීමකින් බැරකම් ලේඛණයේ අවසන් ගිණුමට ඇතුලත් කිරීමට නොහැකි විය. අදාල වවුචර්පත් සැකසීම ගිණුම් අංශය වෙත ඉදිරිපත් නොවූ බැවින් මෙම වැය විෂයන් වලට අදාළ බැදීම් හා බැරකම් ලේඛණයට ඇතුලත් කිරීමට නොහැකි විය.	වර්ෂයට අදාල සියළුම බැදීම් සහ බැරකම් නිවැරදිව වාර්තා කිරීමට කටයුතු කල යුතුය
(ආ)	මු.රෙ. 94 (1) ට පටහැනිව 2024 දෙසැම්බර් 31 දිනට වැය විෂයන් 05ක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන ඉතිරිය ඉක්මවා එකතුව රු. 2,473,462ක බැරකම් වලට එලඹ තිබුණි.	ගමන් වියදම් සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන නොලැබීම හේතුවෙන් ප්‍රතිපාදන ඉක්මවා බැදීම් වලට එළඹීමට සිදුවී ඇති බව දන්වමි.	රෙගුලාසි ප්‍රකාරව වියදම් පාලනය කර ගැනීමටත් ප්‍රතිපාදන සීමාව තුල බැරකම් වලට එලඹීමටත් කටයුතු කල යුතුය.

3.4 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරී ගේ අදහස් දැක්වීම	නිර්දේශය
අම්පාර දිස්ත්‍රික්කයේ, කල්මුනේ Groyne field නිර්මිතය ඉදිකිරීම වෙනුවෙන් රු.මි. 46.99 ක ඇස්තමේන්තුවක් පිළියෙල කර තිබූ අතර එය 2024 අගෝස්තු 01 දින සිට දෙසැම්බර් 31 දින දක්වා මාස 5ක් තුළ නිම කිරීමට සැලසුම් කර තිබුණි. ඒ සඳහා වූ මූල්‍ය ප්‍රතිපාදනය ජනාධිපති ලේකම් කාර්යාලය විසින් සලසා තිබුණු නමුත් එහි භෞතික කාර්ය සාධනය සියයට 40 ක මට්ටමකින් හා එහි මූල්‍ය කාර්යසාධනය රු.මි. 0.26ක් වූ සියයට 16.17 ක වැනි ඉතා අඩු මට්ටමක පැවතුණි.	පිළිතුරු ලබා දී නොමැත.	ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් පරිදි අදාළ කාර්යයන් නියමිත කාලවකවානුව තුළ නිමකිරීමට කටයුතු කල යුතුය.

3.5 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.	රජයේ විගණන අංශය හා දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන අංශය මගින් පෙන්වා දෙනු ලබන විගණන නිරීක්ෂණ සැලකිල්ලට ගනිමින් ඒවා නිවැරදි කර ගැනීමට කටයුතු කර ඇතිබව දන්වීම්	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය.

3.6 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

	නිරීක්ෂණය			ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
	නීති, රීති හා රෙගුලාසිවලට යොමුව	වටිනාකම රු.	අනුකූල නොවීම		
(අ)	1981 අංක 57 දරන වෙරළ සංරක්ෂණ පනතේ 31 (4) වගන්තිය	-	2015 සිට 2024 දෙසැම්බර් 31 දින දක්වා කඩා ඉවත් කිරීමේ නියෝග නිකුත්කර තිබූ අනවසර ඉදිකිරීම් ඉවත් කිරීම් වෙනුවෙන් දෙපාර්තමේන්තුවට අයවිය යුතු රු. 3,492,801ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.	ඉදිරිපත්කර ඇති තොරතුරු නිවරැදියි . ගෙවීම් පැහැර හැර ඇති අය සඳහා නීති මගින් කටයුතු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් පවතී.	අනවසර ඉදිකිරීම් වෙනුවෙන් දෙපාර්තමේන්තුව දරනලද පිරිවැය අදාල පාර්ශවයන් ගෙන්කඩින මින් අයකර ගැනීමට කටයුතු කල යුතුය.

(ආ)	2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය	-	දෙපාර්තමේන්තුවේ වාහන 28 ක් හා යන්ත්‍ර 18 ක් සම්බන්ධයෙන් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව ඉන්ධන පරීක්ෂාවන් සිදුකර නොතිබුණි.	ඉන්ධන පරීක්ෂාව විධිමත් ලෙස කිරීමට කටයුතු කරමින් පවතී.	චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(ඇ)	භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ 2020 නොවැම්බර් 09 දිනැති අංක TOD/REV/M3/02/01 දරන ලිපිය	-	භාණ්ඩාගාර මෙහෙයුම් අධ්‍යක්ෂ ජනරාල් ගණන් දීමේ නිළධාරියා ලෙස කටයුතු කරනු ලබන ආදායම් සංකේතාංක යටතේ එකතු කරනු ලබන ආදායම් පිළිබඳව අදාල ගණන් දීමේ නිළධාරීන් විසින් අර්ධ වාර්ෂිකව ආදායම් පිළිබඳව හිඟ ආදායම් වාර්තා ඉදිරිපත් කළයුතු වුවත් 2019, 2020 හා 2021 වසරවලදී ධීවර වරාය පහකින් වැලි ඉවත් කිරීම සඳහා බලපත්‍ර නිකුත් කිරීම වෙනුවෙන් අයවිය යුතු රු. 8,268,292ක හිඟ ආදායම වාර්තාකිරීමට කටයුතු නොකර ඒ වෙනුවට කිසිදු හිඟ ආදායමක් නොමැති බවට වාර්තාකර තිබුණි.	2019, 2020 හා 2021 වර්ෂවල වලට අදාලව ධීවර වරාය 05 කින් වැලි ඉවත් කිරීමට බලපත්‍ර නිකුත් කිරීම වෙනුවෙන් දෙපාර්තමේන්තුව වෙත අයවිය යුතු රු. 9,695,500.00 ක මුදලින් 2024. 12. 31 දින වන විට රු. 3,681,624.96 අය කර ගෙන ඇති අතර ඉතිරි 6,627,479.52 ක මුදල අය කර ගැනීමට කටයුතු කරමින් පවතී. ඉදිරියේදී හිඟ ආදායම් පෙන්වීමට කටයුතු කරන බව දන්වමි.	හිඟ ආදායම් වාර්තාව නිවැරදිව ඉදිරිපත් කිරීමට කටයුතු කලයුතුය.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 දැක්ම හා මෙහෙවර

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	1981 අංක 57 දරන වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ පනතේ 7 (ඉ) හා 12 වගන්ති සහ 2018 වසරේ සංශෝධිත උපදේශක සභාව විසින් අනුමත කරන ලද වෙරළ කළමනාකරණ සැලැස්මේ 6.4.6 ඡේදය ප්‍රකාරව උපදේශක සභාවට බලපත්‍ර නිකුත්	වෙරළ කලාපයේ සීමාකල ප්‍රදේශය, කිසිදු සංවර්ධන කාර්යකින් තොරව පවත්වා ගැනිම සුදුසු කළමනාකරණ ක්‍රියාවලියක් වන නමුත් වෙරළ කලාපයේ ඉඩම් පරිහරණය, අධික ජනසනත්වය, ඉඩම් කැබලිවල ප්‍රමාණය සහ වෙරළ ඛාදනයේ සීඝ්‍රතාවය සැලකිල්ලට ගත් විට මෙය සාමාජීය වශයෙන් සෑම විටම	අදාළ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය.

	කිරීමේ බලයක් නොමැති අතර පොදු කටයුතු සඳහා මිස පස සිටුවෙන් නිදහස් ව පෞද්ගලික කටයුතු සඳහා බලපත්‍ර නිකුත් කිරීම පිණිස නිර්දේශ ලබාදීමේ බලයක් ද නොමැත. තවද සංවර්ධන කාර්යය සඳහා වෙනත් විකල්පයක් නොමැති අවස්ථාවක දී පමණක් ඉදිකිරීම් රහිත "වෙන්කළ ප්‍රදේශය" මහජනතාවගේ පෞද්ගලික නොවන පොදු සංවර්ධන කාර්යයන් සඳහා පමණක් වෙරළ පස සිටුවෙන් නිදහස් කිරීම අනුමත කිරීම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාට කළ හැක. එසේ වුවද, සමාලෝචිත වර්ෂය තුළ පවත්වන ලද උපදේශක සභා රැස්වීම් වාරයන් 04ක දී වෙන් කරන ලද ප්‍රදේශයන් තුළ ඉදිකිරීම් සඳහා විරුද්ධත්වයක් නොමැති බවට පෞද්ගලික අයදුම්පත් සඳහා බලපත්‍ර 343 ක් ලබා දී තිබීම හේතුවෙන් බලපත්‍රයක් ලබාදීමෙන් අපේක්ෂිත වෙරළ කලාපය තුළ සංවර්ධන කටයුතු මඟින් සිදුවන අහිතකර බලපෑම් වැළැක්වීම හෝ අවම කිරීම යන අරමුණ ඉටුවී නොතිබුණි.	පිලිගත නොහැකි බැවින් මෙ සඳහා වඩාත් ලිහිල් කළමනාකරණ ක්‍රමෝපායක් අවශ්‍යවේ. වෙරළ කලාපය තුල විවිධ කර්මාන්ත වලින් වැඩි ප්‍රතිශතයක් මෙම වෙරළ ආශ්‍රිත නගරවල ස්ථාන ගතවී ඇත. එයිනුත් සංචාරක කර්මාන්තය සහ ධීවර කර්මාන්තය ඍජුවම මෙම වෙරළ කලාපය හා සම්බන්ධවේ. කලින් කලට බලය ලබාගන්නා ආණ්ඩු විසින් රටෙහි සංවර්ධනය උදෙසා ගනුලබන විවිධ ප්‍රතිපත්තිමය තීන්දු තීරණ හේතුවෙන් වෙරළ කලාපයේ සිදුවන සංවර්න කටයුතු වලදී ඒවාට බාධාවක් නොවන අයුරින් සහ අදාළ සංවර්ධන කාර්ය සඳහා වෙනත් විකල්පයක් නොමැති අවස්ථාවලදී සාධාරණ කරුණු සැලකිල්ලට ගනිමින් හා එමගින් වෙරළ කලාපයට සිදුවන අහිතකර බලපෑම අවම කරමින් උපදේශක සභාව වෙරළ කලාපයේ සංවර්ධන කාර්යයන් සඳහා නිර්දේශ ලබාදීම සිදුකරනු ලබයි. කෙසේ වුවද වෙරළ කලාපයේ වෙරළ රක්ෂිත සීමාව තුල පවතින පැරණි ගොඩනැගිලි අලුත්වැඩියා කිරීම සඳහා සාධාරණ හේතු මත වෙරළ සංරක්ෂණ උපදේශක සභාවේ නිර්දේශ යටතේ අලුත්වැඩියා කිරීම සඳහා විරුද්ධත්වයක් නොමැති බව දක්වා අවසර ලබා දී ඇත. ඒ සඳහා වෙරළ කලාප සහ වෙරළ සම්පත් කළමනාකරණ සැලැස්මේ අවශ්‍ය උපදෙස් ලබාදී ඇත.	
(ආ)	මිරිස්ස බන්ඩරමුල්ල ප්‍රදේශයේ මීටර් 120ක දිගින් යුතු ශරීරසුවතා මංතිරුවක් ඉදිකිරිම හා වෙරළ ආරක්ෂක පැති බැම්මක් ඉදිකිරිම සඳහා රු.මි. 7ක මුල්‍ය ප්‍රතිපාදන සමාලෝචිත වර්ෂය තුළ වෙන්කර තිබුණද ශරීර සුවතා මන්තිරුව ඉදිකිරීම වෙරළ සංරක්ෂක දෙපාර්තම්නේතුවේ අරමුණ වලට පරිබාහිර ක්‍රියාකාරකමක් විය.	අදහස් දක්වා නොතිබුණි	වෙරළ සංරක්ෂක දෙපාර්තම්නේතු පනතේ අරමුණ ප්‍රකාරව කටයුතු කල යුතුය.

4.2 කාර්ය භාරයන් ඉටු නොකිරීම

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
2024 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව වර්ෂය තුළ රු.මිලියන 9.5 ක ප්‍රතිපාදන යටතේ නිම කිරීමට සැලසුම් කර තිබූ මාතර මඩිහ ප්‍රදේශයේ වෙරළ ආරක්ෂක නිර්මිතයක් ඉදිකිරිම, වර්ෂ 2021 සිට ක්‍රියාත්මක වෙමින් පැවති ත්‍රිකුණාමලයේ ස්ථිර වෘක්ෂලතා රේඛාව සලකුණු කිරීම පිළිබඳ සමීක්ෂණය යන කාර්යන් ඉටුකර නොතිබුණි.	අදහස් දක්වා නොතිබුණි .	ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් පරිදි අදාළ කාර්යයන් නියමිත කාලවකවානු තුළ නිමකිරීමට කටයුතු කල යුතුය.

4.3 අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම.	නිර්දේශය
(අ)	2012 සිට 2024 දෙසැම්බර් 31 දින දක්වා ශ්‍රී ලංකා වෙරළ තීරයන්හි පසසිටුව ප්‍රදේශයන් තුල බලපත්‍ර ලබා ගැනීමකින් තොරව සිදුකර ඇති ඉදිකිරීම් සඳහා කඩා ඉවත් කිරීම් නියෝගයන් පනවා තිබූ අනවසර ඉදිකිරීම් 3,039 කින් 2,825ක් ඉවත් කිරිමට කටයුතු කර නොතිබුණි.	පිළිගනිමි. ඉදිරිපත් කර ඇති තොරතුරු නිවැරදියි	නිසි සැලසුම්ගත වැඩපිළිවෙලක් ඔස්සේ අනවසර ඉදිකිරීම් ප්‍රමාදයකින් තොරව ඉවත් කිරීමට කටයුතු කළ යුතුය.
(ආ)	ඉදිරිපත් කරන ලද කාර්යසාධන වාර්තාවට අනුව සමාලෝචිත වර්ෂයේදී නිමකිරීමට සැලසුම් කර තිබූ ඇස්තමේන්තුගත වටිනාකම රු.මි. 52.52 වූ පුත්තලම උතුරු උඩප්පුව ප්‍රදේශයේ මීටර් 200 කින් යුත් පැති බැම්මක් (Revetment) ඉදිකිරිම, ගාල්ල හතපලාන මීටර් 30 ක දිගින් යුත් ගොයින (Groyne) නිර්මිතය ඉදිකිරීම හා අම්පාර දිස්ත්‍රික්කයේ පොතුවිල්, විස්කි පොයින්ට් හි Geobag Groyne නිර්මිතය ඉදිකිරීම යන ව්‍යාපෘති 03 හි භෞතික ප්‍රගතිය සියයට 20 කට වඩා අඩු මට්ටමක පැවති අතර එහි මුල්‍ය ප්‍රගතිය ද සියයට 12 කට වඩා අඩු මට්ටමක පැවතුණි.	අදහස් දක්වා නොතිබුණි.	ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් පරිදි අදාළ කාර්යයන් නියමිත කාලවකවානුව තුළ නිමකිරීමට කටයුතු කල යුතුයග

4.4 වත්කම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම.	නිර්දේශය
(අ)	2005 වර්ෂයේ ලියාපදිංචි කළ නමුත් ගිණුම්ගත කිරීමකින් තොරව පරිහරනය කරන ලද දෙපාර්තමේන්තුවට හිමි යතුරු පැදියක් අස්ථානගත වී තිබුණි. තවද, එම යතුරු පැදිය සඳහා 2015 වර්ෂයෙන් පසුව ආදායම් බලපත්‍ර ලබාගැනීමට කටයුතුකර නොතිබුණු අතර අස්ථානගත වීම සම්බන්ධයෙන් මෙම වාර්තාවේ දින දක්වා කිසිදු පරීක්ෂණයක් සිදුකර නොතිබුණි.	අදාල යතුරුපැදිය දැනට පවතින ස්ථානය සොයාගැනීමට කටයුතු කරමින් පවතින අතර මෝටරථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවෙන් ඉදිරිපත් කර ඇති තොරතුරු අනුව යතුරුපැදියේ ආදායම් බලපත්‍රය අවසන්වරට 2014 වසරේදී ලබාගෙන ඇත. මෙම යතුරුපැදිය 2006.11.11 දින දෙපාර්තමේන්තුවේ රාජකාරි කල නිලධාරියෙක්ට නිකුත්කර ඇති අතර ඔහු යතුරුපැදිය භාරගත් බවට අත්සන් කර ඇත. ඔහු මේ වන විට දෙපාර්තමේන්තුවේ සේවයේ හැර ගොස් ඇත.	නොසැලකිලිමත් භාවයෙන් හා අනවධානයෙන් කටයුතු කල නිලධාරීන් සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ II වන කාණ්ඩයේ XLVIII පරිච්චේදයේ 29 වගන්තිය යටතේ විනයනුකූලව කටයුතු කල යුතුය.
(ආ)	මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වටිනාකම රු.මිලියන 11.9 ක් වූ Volvo Excavator යන්ත්‍රය 2019 සැප්තැම්බර් සිට භාවිතයට නොගෙන ගාල්ල කාර්යාල පරිශ්‍රයේ දිරාපත්වෙමින් පැවති අතර අපහරන කිරීම සඳහා 2021 වසරේ ප්‍රධාන කාර්යාලය වෙත යොමුකර තිබුණු නමුත් එම යන්ත්‍රය අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි	අපහරණය කලයුතු වාහන අපහරණය සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින අතරම, PD – 1046 රථයේ අයිතිය පවරා ගැනීමට අවශ්‍ය ආකෘති පත්‍ර පුරවා ලබා දී ඇති අතර 2023.10.26 දින මේ සම්බන්ධ තොරතුරු විමසා ලිපියක් යොමු කර ඇත.	යන්ත්‍ර සම්බන්ධයෙන් නිසි අවධානය යොමු කර අවශ්‍ය වන අලුත්වැඩියාවන් හා අපහරණයන් සිදු කළ යුතුය.
(ඇ)	මොරටුව ප්‍රාදේශීය කාර්යාලයේ Hyundai 320LC - 9 Crawler Excavator යන්ත්‍රය දීර්ඝ කාලයක සිට භාවිතා නොකර නවතා දමා තිබීමෙන් ධාවනය කළ නොහැකි තත්ත්වයට පත්ව තිබූ නමුත් මේ පිළිබඳව වගකිවයුතු නිළධාරින්ගේ අවධානය යොමු වී නොතිබුණි.	රජයේ කර්මාන්තශාලා දෙපාර්තමෙන්තුව වෙත යොමු කරන ලද ලිපියක් මගින් අදාල අළුත් වැඩියා සිදු කර දෙන ලෙස ඉල්ලීමක් කර ඇත.	යන්ත්‍ර නිසි අධීක්ෂණයක් සහිතව කාර්යක්ෂමව භාවිතා කිරීම කෙරහි නිසි අවධානය යොමු කළ යුතුය.

4.5 කළමනාකරණ දූර්වලතා

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	උණවටුන ප්‍රදේශයේ පුද්ගලික සමාගමකට අයත් හෝටලයක ඉදිකිරීම සම්බන්ධ පරීක්ෂාවේදී ගාල්ල දිසා අධිකරණයේ පවරා තිබූ අංක 16813 දරන බෙදුම් නඩුව ප්‍රකාරව 1924 පෙබරවාරි 09 දින බෙදා වෙන් කරන ලද 9A පිඹුරෙහි වූ ඉඩම් කැබලි 06 හි ඇතුළත් ඉඩමේ ප්‍රමාණය පර්චස් 122.69 ක් වුවද 2018 අප්‍රේල් 30 දිනැතිව සාදන ලද අංක 1154 දරන පිඹුර ප්‍රකාරව එම ඉඩම් කැබලි 06 හි ප්‍රමාණය පර්චස් 156.11ක් වීමෙන් පර්චස් 33.42කින් ඉඩමේ ප්‍රමාණය වැඩිවීම මුහුදු වෙරළ ගොඩකර තිබීමක්ද යන්න මතභේදාත්මක විය.	ඉදිරිපත්කර ඇති ගාල්ල දිසා අධිකරණයේ පවරා ඇති අංක 16813 බෙදුම් නඩු ප්‍රකාරව ඉදිරිපත් කර ඇති පිඹුරුපත් වලට (අංක. 16813 -1924 වසරේ සහ 1154 – 2018 වසර) අනුව බැලූ බැල්මටම මුහුදු වෙරළ ගොඩකිරීමක් ලෙස පෙනීයන අතර මෙම දෙපාර්තමේන්තුව ආරම්භ කල වසර සිට (1983) භෞතිකව මහාපරිමාණයෙන් ගොඩ කිරීමක් සම්බන්ධයෙන් වාර්තා වී නොමැති අතර වාර්තාවී ඇති සංවර්ධන කාර්යන් හා ගොඩකිරීම් සඳහා පනත ප්‍රකාරව කටයුතු කර ඇත. තවද එම කාල පරතරය වසර 90 කට වඩා ඩැඩිවන අතර මෙම දෙපාර්තමේන්තුව ආරම්භ කල දිනටද වසර 60 කට ආසන්න කාල පරාසය තුල වෙරළෙ ඉහත දක්වා ඇති ආකාරයට වැලි පිරීමක් සහ භෞතිකව (අනවසර) පිරවීම් සිදුවී ඇති අතර එම බිම්කොටසේ ක්‍රමිකව තුරුලතා ඇතිවීමක් සිදුව ඇත.	වෙරළ සංරක්ෂණ පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය.
(ආ)	ඉහත ඉඩමේ පෙර අයිතිකරු වෙරළ තීරයේ සිට මීටර 18.3 ක පමණ දුරින් අනවසරයෙන් ඉදිකරමින් පැවති දිග අඩි 21.9 හා උස අඩි 05 ක පමණ ප්‍රමාණයේ බැම්ම, පනතේ 31(2) වගන්තිය යටතේ කඩා ඉවත් කිරීමට 2016 නොවැම්බර් 09 දින වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් නියෝගයක් නිකුත් කර තිබුණද, එය නොසලකා හබරාදූව ප්‍රාදේශීය ලේකම්ගේ ලිපිය මඟින්, සෝදා පාළුව වැලැක්වීම සඳහා වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ	මෙහි සඳහන් ඉඩමේ අනවසර බැම්ම 2016 නොවැම්බර් මස ලබාදී තිබූ කඩාඉවත් කිරීමේ නියෝග මත ඉවත්කිරීම සිදුකර ඇත. ඉඩම රජයේ කොටසද ඇතුලත්ව 2018.04.26 අදින ලද අංක. 1154 සැලැස්ම ප්‍රකාරව හෝටල් පුද්ගලික සමාගමක් වෙත විකුනා ඇත. මෙම ඉඩමේ පිරවීම් හා පිරීම් හේතුවෙන් රජයට හිමි කොටස් මැන වෙන්කිරීම සඳහා මෙම දෙපාර්තමේන්තුව, හබරාදූව ප්‍රාදේශීය ලේකම් මගින් කළ ඉල්ලීමට අනුව මිණින්දෝරු දෙපාර්තමේන්තුව විසින් 2022.02.14 දිනැති CL/SQB/2022/07 දරන අනුරේඛණය සකස්කර ඇත. ඒ අනුව හා ඒ වන විට වර්තමාණ අයිතිකරුට එම ඉඩමට යාබදව රජයට අයත් ඉඩම් කොටස පරිහරනය කිරීමට ප්‍රාදේශීය ලේකම් විසින් අවසර ලබා දී ඇත. පැවති කාලගුණ විපර්යාස හේතුවෙන් රජයට අයත් මෙම ඉඩම් කොටස බාදනයට ලක්වී ඇත. එය වැලැක්වීම රජයට අයත් කාර්යක් වුවද ඒ සඳහා දෙපාර්තමේන්තුවට ප්‍රතිපාදන නොමැති පසුබිමක, ඉහත සමාගම විසින් වෙරළ ආරක්ෂිත බැම්මක් සඳහා කරන ලද ඉල්ලීම සලකා බලා ඒ සඳහා 2022.01.19 දාතමින් අංක.	වෙරළ සංරක්ෂණ පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය.

නිර්දේශ යටතේ බැම්ම ඉදිකිරීම සඳහා ඉඩමේ වර්තමාන අයිතිකරු වෙත අවසර ලබාදීමට කටයුතු කර තිබුණි.	CCCRM/PM3992 දරන බලපත්‍රය ලබාදීම සිදු කර ඇත.	

5. තිරසර සංවර්ධන අරමුණු ළගා කර ගැනීම

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
අහිතකර මානව බලපෑම් වළක්වා ගැනීම සඳහා සාගර සහ වෙරළබඩ පරිසර පද්ධති තිරසර ලෙස සංරක්ෂණය කිරීම යන ඉලක්ක යටතේ බලපෑමට ලක් වූ ප්‍රදේශ හඳුනාගෙන කළමනාකරණය කිරීම සහ ආරක්ෂා කිරීම සඳහා වැලි කඳු, කඩොලාන සහ ලවණ වගුරු හා සංවේදී පරිසර පද්ධති හෙක්ටයාර 70 ක් සංරක්ෂණය කිරීම යන ඉලක්කය කරා ලඟා වී නොතිබුණි.	අදහස් දක්වා නොතිබුණි.	සැලසුම්ගත කාර්යයන් ක්‍රියාත්මක කර තිරසර සංවර්ධන ඉලක්ක කරා ලඟා විය යුතු අතර එසේ කළ නොහැකි අවස්ථාවන්වලදී සැලසුම් සංශෝධනය කර ඒ අනුව කටයුතු කළ යුතුය.

6. මානව සම්පත් කළමනාකරණය

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
2024 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ 541 ක් වූ අනුමත සේවක සංඛ්‍යාවෙන් 150ක් පුරප්පාඩු වූ අතර ඊට ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 15 ක්, තෘතීය හා ද්විතික මට්ටම්වල තනතුරු 75 ක් හා ප්‍රාථමික මට්ටමේ තනතුරු 60 ක් ඇතුලත් විය. අනුමත සංවර්ධන නිලධාරී තනතුරු 90 ක් වුවද, තත්‍ය සංඛ්‍යාව 104 ක් වූයෙන් 14 ක අතිරික්තක් විය. තවද, එක් නිලධාරියෙකු බැගින් පමණක් අනුමත වූ ජ්‍යෙෂ්ඨ හා තෘතීය මට්ටමේ තනතුරු 3 ක, කිසිදු නිලධාරියෙක් සේවයේ නොයෙදී තිබුණි. ඒ අනුව තත්‍ය වශයෙන් පවතින තනතුරු සංඛ්‍යාව මත රාජකාරි කටයුතු පවත්වාගෙන යාමේ හැකියාව පිළිබඳව සමාලෝචනය කර අවශ්‍යතාවය අනුව සංශෝධනයන් සිදුකර ගැනීමට කටයුතු කර නොතිබුණි.	නියෝජ්‍ය අධ්‍යක්ෂ හා සහකාර අධ්‍යක්ෂ(දෙපාර්තමේන්තු ගත) තනතුරු 06 පුරප්පාඩු සඳහා බඳවා ගැනීමට අනුමැතිය ලබා ගැනීම පිණිස කළමනාකරන සේවා දෙපාර්තමේන්තු වෙත ඉදිරිපත් කර ඇත. මේ වන විට දෙපාර්තමේන්තුවේ 541 ක් වන අනුමත සේවක සංඛ්‍යාවෙන් තත්‍ය සංඛ්‍යාව 404 ක් වන අතර පුරප්පාඩු සංඛ්‍යාව ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 16 ක්, තෘතීය මට්ටමේ පුරප්පාඩු 03 ක්, ද්විතීය මට්ටමේ පුරප්පාඩු 57 ක් සහ ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු 61 ක් ලෙස මුළු පුරප්පාඩු සංඛ්‍යාව 137 ක් වෙයි.	අවශ්‍ය අනුමැතීන් ලබාගෙන බඳවා ගැනීම් සිදු කිරීමට හෝ පවතින කාර්යමණ්ඩලය මත කටයුතු පවත්වාගෙන යාමේ හැකියාව පිළිබඳව සමාලෝචනය කර තනතුරු සංඛ්‍යාව සංශෝධනය කර ගැනීමට කටයුතු කළ යුතුය..